
# ලන්ඩන් කවි
# LONDON KAVI

2 Queens Parade, Green Lanes, London, N8 0RD
Tel: 020 8347 6151, Fax: 020 8348 0660, Email: kavi@londonkavi.com
Free Circulation - Vol 1 Issue 2 November - December 2003

**ටෝනි බ්ලෙයාර් සහ ඔහුගේ ම බිරිඳ කොරියාවේ සංචාරයක යෙදුණි. කොරියානු තරුණ තරුණියන් පිරිසක ගේ ඉල්ලීමක් සපුරනු වස් ඇය ගීතයක් ගායනා කළා ය.**

ආදර පියඹ රස ගීයක ගයන වීට
බෙරයක් වයන්නට ඇත්නම් අගෙයි මට
අමතක කරන්නට කරදර තිබෙන රට
වැයුමෙන් අඩව්වෙන් පිළිවන් වේද මට

## පතනෙමු දිගාසිරි



සැත්තෑපස් වියට සපැමිණි පිරි පාණ
මහ බිරිතනියෙ සඟ නායක අසමාන
මැදගම වජිර නැණ ගුරු දෙව් සම්දාන·
පතනෙමු දිගාසිරි බැතියෙන් අපමාන

ලන්ඩන් බෞද්ධ විහාරාධිපති මහා බ්‍රිතාන්‍යයේ ප්‍රධාන සංඝනායක පූජ්‍ය ආචාර්ය මැදගම වජිරඥාන නායක හිමියන් පසුගිය දා සැත්තෑ පස්වැනි වියට පත් වූ සේක. 1967 සිට 1980 දක්වා ද 1984 සිට අද දක්වා ද ලන්ඩනයේ බ්‍රිතාන්‍ය හා සිංහල බෞද්ධයනට ධර්මානුශාසනයෙහි යෙදෙන උන් වහන්සේ ඒ හැමදෙනා ගේ ම මහත් වූ ආදර ගෞරවයට පාත්‍ර වූහ.

## නොඑමි

"ලංකාව
කුණු වී ගිය බිත්තරයකි,
වෙස් මුහුණන්ගේ රටකි,
යුක්තියෙන් තොර දේශයකි

මල්ලී ඔබත් එන්න
ඕස්ට්‍රේලියාවට
අපිත් එක්ක සැපෙන් ඉන්න

අක්කාත් - නංගීත් - තාත්තාත්
දැන් මෙහේ වැඩ
අපි සැවොම ජීවිතය රහ බලමු
ගැලවී ඔහේ ඇති කර්මයෙන්
ලෙඩ දුකින්
පන්දම්වලින්
යක්ෂයින්ගෙන්
භූතයින්ගෙන්
කෝටියක් දෙවි දේවතාවුන්ගෙන්......

මල්ලීට මෙහි විද්‍යා පීඨයක
උගන්වන්න පත්වීමක් ගන්න හැකිය
මල්ලී ඔබත් එන්න
පවුලේ කිසි කෙනෙක් නැතිව
තනිවී ඔහි පලක් ඇද්ද?"

"ලංකාව
කුණුවී ගිය බිත්තරයකි
වෙස් මුහුණන්ගේ රටකි
යුක්තියෙන් තොර දේශයකි"

අයියෙ ඔබේ ලිපියේ බස
එක් අතකින් සැබෑවක් ය

මෙහි ඔබේ ශ්‍රමය - වෙරගසාකෑ බව සැබෑයි
මෙහි ඔබේ සුදුසුකම් වල ඇමූ බව සැබෑයි
මෙහි ඔබේ ගෞරවය කැලැල් කළ බව සැබෑයි
මෙහි ඔබේ සේවයෙන් පල නොලත් බව සැබෑයි

මින් පිටව
ඔබ සැවොම ජීවිතය රහ බලති
මම තනිව මෙහි සිටිමි
එහෙත් මට
මින් පිටව
ආ නොහැක

භග්‍යවත් හිරුත් නටයි නිරක්ෂයේ දිලී
හෙලේ සඳා සාදරෙන් පායාලා අහෝ
නිල වර්ණ ගීතයෙන් ඇලත් දොලත් ගලා
වැහි බිජුත් වැටී උඩින් - කරල් නැගේ මින්

පන්තියට ගිය වෙලේ
එතැන මගෙ පිරිවරයි
බස් එකේ සිටින කල
මැවෙයි ගෙදරක් එතැන

කටට කට තියා යන
කුහුඹුවන් විලාසෙන්
වීදියේ පෙරහැරය
නෙත් කොනින් සැර එවන
බහ දොඩන - සිනාසෙන
වෙස් මුහුණ බිඳ දමා
කුණු සැරව වල දමා
යුක්තියේ දේශයක් තැනීමට
බිත්තරයෙන් පිටව ගිය පරපුරට
අයත් වෙමි
ඉන් පිටව
මම
නොඑමි

**පරාක්‍රම කොඩිතුවක්කු**

## ලියක මහිම

දේදුනු දෙබැම අඩසඳ මත කියඹු වැල
දිගු වරලස සිහි ගන්වයි මොණර පිළ
නීල උපුල් දොඩමළු වී රඟන කල
නාදළු දෙතොල් මැද සැඟවෙයි දෙමුතු වැල

රණහස ළමැද විනිවිද යන දුහුල් පට
මදහස පවන් පිරිපුන් තිසරු වෙන් කොට
සෙනෙහස විදියි මල් ලෝකය දෙපළු කොට
අදහස කිරෙන් දිය වෙන් කර පෙවීමට

නාරිලතා සිහිනිඟ නිතඹ සැලි සැලී
පාද තබා යන විට පවනෙ සිලි සිලී
ආල කතා පැවසෙයි මහදෙ වෙලි වෙලී
දෝරෙ ගලා උතුරයි හැඟුම් යළි යළී

✍ මිලානි පෙරේරා
ලන්ඩනය.

## ලන්ඩනයෙන් හිරු



මාස ගණන්
ලන්ඩනයේ
මා නොදුටුව
හිරු

සුදු හම ගත්
හදවත් තුළ
නිතර නොමැත
හිරු

හිම්දිරියේ
කවුළු තුළින්
ගෙට පැන එන
හිරු

දුම්රිය තුළ
බස්රිය තුළ
මෙරට නොමැත
හිරු

අලස සිතුම්
කුසීතකම්
වියළා ලන
හිරු

දිලෙන වතින්
හද පත්ලෙන්
ලකෙහි නැගෙන
හිරු

මේ විදිහට
මුළු වසරේම
පායයි නම්
හිරු

පුදුමයක් ද
සිහළ ඔබේ
මුළු වසරේම
හිරු

✍ දොස්තර බුද්ධදාස බෝධිනායක - ලන්ඩනය

## මල්ලී වෙතට ලන්ඩනයේ දී ය.....

රුපියල බාල්දුයි පවුමෙන් කිරාමැන
කෙටි කාලෙකින් සරුවෙන්නට පතාගෙන
සුරපුරයකට පිවිසෙන්නට හිතාගෙන
ලන්ඩන් පැමිණි හැටි උඩපැන නටාගෙන

කවුරුත් දුකෙන් සතුටින් සහ මනාපෙන
මට සමුදුන් වගයි ලන්ඩන් බලායන
නිති සිහි කරමි මවුබිම දෙස බලාගෙන
ලන්ඩන් විත්ති ගැන දෙකොණින් හිනායන

ඉංජිනේරුවරු දොස්තර මහත්වරු
පෙරකදෝරු සහ තව ලොකු මහත්වරු
ලංකාවෙදි ලැබගෙන සිටි නම්බුගරු
උඩු යටිකුරු කර ජීවිත පෙරළිකරු

පුංචි ඇඳක දෙදෙනෙකුටත් ඉඩ වැඩිය
තැන තැන දමා ඇත ගෙන ආ අඩු වැඩිය
ඉඩ කඩ සීමිතයි කුඩුවකට වැඩිය
පාන් කන්න බැරි මට බත් බඩගිනිය

කොණ්ඩය කැපීමත් මුදලුත් යුදට වදී
කෙස් ටික දිග වෙවී එයි සිතට වද දිදී
තනි නොතනියට තොප්පිය හිස මතම හිඳී
සමහර රැයක තොප්පිය දා ගෙනම නිදී

පසුගිය කාලෙ රෑ අටටත් හිරු එළිය
දහවල තුනට රෑ මෙන් දැන් කරුවලය
කෑලි කපන තරමට ඇඩි සීතලය
පසුවට ලියමි වැඩ වැඩි වී කලබලය

මල්ලිට ලිවීමත් නො ඇනිම කල් ගෙවුනි
දවසින් දවස අඟ හිඟකම් මඟ හැරුණි
යහළු - යෙහෙළියන් නිතරම මුණු ගැසුණි
අවසන් විභාගය ගිය සතියට යෙදුණි

පවුම්වලින් මේ විදියට ලැබෙයි නම්
කොමළ ලියන් නෙතු සරහා බලයි නම්
අනංගයා දුනු හී සැර වදියි නම්
ලන්ඩන් නුවර තව දිගු කල් සිටින් නම්

✍ සුමනා අදිකාරි - එන්ෆීල්ඩ්, මිඩ්ල්සෙක්ස්.

---

## Ivy Dives!!

Number five is the
fifth number,
Bees live in a Hive,
The trees are called Ives
We've got our lives,
I go to the side
when a car is coming by.

**Navin Perera**
**Stag Lane First School.**

## ඔබ සහ මම

කළු පැහැ ආකාශ පහතින්
සඳ මඬල එබුනා
මේ මමත් ~ ඒ නුඹත් වාගේ
වියළි ගහකොළ දිගට වාගේ
වියළි ගහකොළ දිගට රූරා
තුෂර බිඳු වැටුණා
මේ මමත් ~ ඒ නුඹත් වාගේ
ගතින් දුරවී ~ සිතින් අසලක
එක්වෙලා වාගේ
යකඩ දුම්රිය පීලි දෙදඬුව
දෙපැත්තක වී
එකම මඟ ඇඳුණා
මේ මමත් ~ ඒ නුඹත් වාගේ

✍ ශ්‍යාමලී ගුණතිලක
ලන්ඩනය.

## මතක

මතක
යනු
සිහිය නොව
මරණයයි
ජීවිතය තරම්
දිගු නැති
සුසුමක් සේ
සරල
සනහස
බැඳුණු සිත
අරුණලු සේ
පැහැබර
නුගිනුරා
මතක් කොට
ගැයු ගී හඬ
වියැකෙන්නට පෙර
දෙපෝයයි ගතවුණේ
මැවෙන්නට
සීමාවක්
මහා පවුරක්
හිමාලය වන්

⊏ උදය ප්‍රශාන්ත මැද්දේගම
ලන්ඩන් සරසවිය

## පොත

පළමු සිගරට්ටුව උරන
ගැටවර කොල්ලෙක් සේ
බියගුල්ව සැඟවෙමින්
පත පොත කියවූ මට :
"විභාගය කවද්ද?"
"මොකට ද පොත් කියවන්නේ?"
අනේක ගැටලු නඟමින්
කරදර කරපු රටක
දාර්ශනික, සාහිත්‍යමය,
සෞන්දර්ය සොහොන් කොතක
මිනීවලට සාප කරපු මම
තැති ගත්තෙමි සැබැවින්!

පොත!!!
අසන දකින සියල් දෙනා
උනන්දු වන එකම දෙයකි :
පොත!!!
නමුත්.. .. .. .. !!!
වතුර යට තෙරපා
අත්හල බැලුම් බෝලයක් සේ
කටුක සත්‍යම මතු වී
අලුත් දවසක අරුණලු නොව
කුණු වී ඕජස් ගලන
මිනී වළ ම දිස්විය!

වෙනත් ඉතිහාසයක
වෙනත් අරගලයක් තුළ
වෙනත් මිනිසුන් විසින්
ගොඩනැගූ ලෝකයක
පුරවැසිකම හිඟන
මෙවන් ශ්‍රේෂ්ඨ ජාතියක
දෙදහස් පන්සිය වසක
උදාර සංස්කෘතියක
නිර්මල අධ්‍යාත්මයට
දිය යුතු හොඳ ම පොත
හෝඩි පොත බව
සපත කරගතිමි නැවතත්!

⊏ වංගීස සුමනසේකර
ලන්ඩනය.

## අගයද ඔබ මට

(ඒකස්වර බන්ධනය)



සනසන කලට මම ඔබ මට කරන වද
හදවත දවන බව අමතක කරන වද
රස සටහනක මතකය මට නඟන නද
මතකද ඔබට එය? මම මත මවන වද

'ඔබ අම පහස මට පමණය' යන වදන
අමතක කර දමන ඔබ අද යන ගමන
අචල මහද පදනම තව තව කඩන
චපල කමය හදවත වනසන දවන

'අචල' ඔබ නමය අපහස කරන වද
රමණය පමණම ද හද තරණයට අද
අටක වසර මතකය ඔබ මකන වද
සසර වසන කලටම ඔබ 'නටන' වද

මහ මඟ යන කල ගත නළවන වද
කණකර බරටම නව ඔපයට මද
මඳහස පළකර අවට බලන වද
කමරස උරනට උඩරට යන වද

අසරණ කමට කල සරණය මටම අද
තලනට ඉහළ එන එක මහ පවක ලද
පවටම බරව හදවත ඔබ නටන වද
අගයද ඔබව මට අගයද තවම අද

⊏ තිලක් ප්‍රනාන්දු

බොහෝ කාලයක් ලන්ඩනයේ ජීවත් වන ප්‍රවීණ පුවත්පත් කලාවේදියෙකු, ඉංජිනේරුවරයෙකු සහ ටෙලිනාට්‍ය ශිල්පියෙකු වන තිලක් ප්‍රනාන්දු ලියන ලද ඉහත සඳහන් කවි පන්තිය 'සවස' පුවත්පතේ පළ කරමින් ඩී.බී. ධනපාල මහතා ලියා තිබුණේ 'කවි ලිවීම අමාරු වැඩක්. ඉස්පිලි, පාපිලි, ඇලපිලි, කොම්බු රහිත ව (ඒකස්වර බන්ධන) ලිවීම ඊටත් අමාරු වැඩක්' යන්නයි.

## නත්තල



සීනු හඬින් ලොව පිබිදෙනවා
නත්තල දොර ළඟ හිනැහෙනවා
ගවහලකට තරුවක් යනවා
අහසට පොළොව ගැටේ

තරු එළියේ - කඳු වැටියේ
බෙත්ලෙහෙමේ මංගල එළියේ
මල් වැසි වසිනු පෙනේ

තටු ගෙන සුදු හිම ඉගිලෙනවා
අතු අග මුතු මෙන් බබළනවා
හිරු කැන් සුදු ඊතල වෙනවා
සැම තැන රිදී වගෙයි

දිය සීරා - කඳු පීරා
වන්නම් ගමනින් බැස එනවා
දිය බිඳු ඇඟ සොළවා

දින දින වැහි කළු බර වෙනවා
මහවැලි ගඟ දිය බොර වෙනවා
නත්තල කත් බැඳ ගෙන එනවා
වැහි බර උඳුවපයේ

අරලිය මල් - වතු සුදු මල්
පිබිදී මල් අතු බරවෙනවා
මේ නත්තල් මාසේ

⊏ මර්සිලීනු ජයකොඩි

## ශ්‍රී නිවාස කරවමු ලක් දිව

'අවුකන ගල් වෙහෙර ඇත මහ පිළිම තැණූ
.............................................................................
ආඩම්බරයි ලෝවා මහ පහයෙ කණූ
- *පී.බී. අල්විස් පෙරේරා*

පුතේ ගනිං අලවංගුව!
පෙර කළ දේවල් බල බල
ගුණ ගය ගය
තව කොපමණ කල් ඉඳිමුද?
අද ජීවත්වෙන නුඹලා
වර්තමානයේ මුලාව
අතීතයට ඇයි දුවන්නෙ?

ඔය විදියට හිටියා දැන් හොඳට ම ඇති

'මට පුළුවනි ඔය කැටයම
පරදන කැටයම් කපන්න
මඳ පවනේ සිවුර සැලෙන විලසට
ප්‍රතිමා නෙලන්න
මට පුළුවනි,
ඔය සිතුවම් පරදන සිතුවම් අඳින්න'

ජරාවාස මුරගල් කැටයම් ගලවා ආලා
ශ්‍රී නිවාස කරවමු ලක්දිව අබිමන් පාලා

උපන් පුතකු මේ දෙරණේ
නිදියන තෙක් මිහි සයනේ
පුරසාරම් දෙඩුවෝතිං....................

ගනිං පුතේ අලවංගුව!

දැත දෙපය අවලංගුව
දෑස නොලැබ ගොස් අන්ධව
සිටිමුද අපි?

'පුරාතනේ විසූ රජ දරුවෝ
ගාමිණී මහසෙන් පැරකුම්බා.......

පුතේ ගනිං අලවංගුව!

පෙර කළ දේවල් බල බල
මිග දොඩ දොඩ
හිටියා දැන් හොඳටම ඇති

ㄷ *තිලකරත්න කුරුවිට බණ්ඩාර* - 1968.

## Images from Manampitiya



Surrounded by miles of thick forest,
In the cleft of a rock's steep face,
Still as a statue, a hermit meditates,
On what? - I'll never know,
In the torrid sun, by a gurgling stream,
Dreamily, a maiden combs her hair incessantly
Crouching in a goraka-tree a restless monkey
Stares intently, disclaimfully
A crocodile slithers into the murky stream,
As the monkey shrieks mockingly
In the distance I hear the hollow resonance
of an elephant trumpeting
Words on a board nailed to a tree-trunk;
"BENEATH THIS TREE WAS FOUND
THE HEADLESS BODY OF A SOLDIER"
Time passes like the whisper
of wind passing through forest-trees
Under the cool shade of a bamboo-tree
I sit eating buffalo-curd and treacle.......
While in the distance,
purply-grey storm-clouds slowly gather

**Denis Jansz**
**London**

**Note:-**
**Manampitiya-a village 40 miles from Polonnaruwa and 20 miles from Kalkuda.**

## Sports

Football what a goal!
Golf what a swing!
Cricket what a wicket!
Racing what a crash!
Tennis what a whack!
Swimming what a splash!

I love sports,
No matter the weather
As long as we play
All together

**Devin Weerasinghe**
**Year 3**

## තණ හේන

එක්තරා හාමුදුරු නමක් දානය පිණිස ප්‍රමාද වී වැඩි සේක්, තණ හේනක් මැදින් යා යුතු ව තිබූ නිසා දෙපැත්තෙන් වැටී ඇති තණ කරල් නොපෑගෙන්නට ඒවා දෙපසට කරමින් වැඩියහ. එය ජනකවියෙකු දුටුවේ මෙසේ ය.

සරුවන් කෙතේ බිජු වපුලේ පැළ වෙන්ට
මැරුවත් බැරිය දුටු දෙය නොකියා ඉන්ට
බොරුවක් නොවේ මට ජාතියෙ කඹුරන්ට
වරුවක් පොරේ තණ දෙක හරවා ගන්ට

**ජනවාරි කලාපය සඳහා ඔබ ගේ නිර්මාණ**
**London Kavi, No. 5, Queens Parade Green Lanes, London, N8 0RD**
**වෙත යොමු කරන්න.**


සංස්කාරක
අනුර හැගොඩ
**Editor**
Anura Hegoda
සංස්කරණ සහය
යසිරු සමරකෝන්
මලිත් හැගොඩ
අනෝමලී - අනුත්තරා
**Editorial Assistance**
Yasiru Samarakoon
Malith Hegoda
Anomali - Anuthara
වෙබ් අඩවි නිපැයුම
කසුන් පලන්සූරිය
**Web Design**
Kasun Palansuriya

# අන්ද කාරයට දැල්වූ පහන මෙන<br>කින්ද තනි යහන නිදියන්නේ නෝන



ශ්‍රී ලංකා කවි කලා අඹර නොයෙක් ආකාරයේ කවියන් ගෙන් සහ කාව්‍යක්කාරියන් ගෙන් වරින්වර බැබළිණ.

කොල්ලුපිටියේ බරන්දෙණියේ දෝණගම්පිට තුප්පහි ගේ වත්තේ උපත ලද දෝන ඉසබෙල් පෙරුමාල් කොරනේලියා හෙවත් ගජමන් නෝනා නමින් පසුකලෙක දී සුප්‍රසිද්ධියට පත් කාව්‍යක්කාරිය ශ්‍රී ලංකා කවි අඹර දීප්තිමත් කළ තාරකාවක් වූවා ය. ඇය ජීවත් වූයේ රති සාහිත්‍යය රජ කළ මාතර අවදියේ ය. ගැමි කවියෙහි එන ශෘංගාරය ජීවිතයට ඉතා සමීප බැවින් එයින් ඉමහත් රසයක් ඉපදෙයි. ගජමන් නෝනා ගේ ජනප්‍රිය භාවයට ප්‍රධාන ම හේතුව වී ඇත්තේ එවන් ශෘංගාරාත්මක කවි බොහෝ ප්‍රබන්ධ කොට තිබීම ය. මහගම සේකර ශූරීන් ගේ මතය වූයේ වර්තමාන කාව්‍ය සම්ප්‍රදායේ මුල මාතර යුගය බවත් ගජමන් නෝනා ඊට ප්‍රධාන බවත් ය. ඇය ගේ පියා අලි බැලූ ආරච්චිල කෙනෙකු වූ නිසා ඇය ගේ නමටත් ගජමන් යන්න එක් වූවා වන්නට ඇත. ගජමන් නෝනා ගේ මාමා වූ පත්තෑයමේ ලේකම් තුමා, සිටිනාමළුවේ ධම්මජෝති හිමි ආදී සාහිත්‍යකාමී උගතුන් ගේ ආශ්‍රයෙන් සිංහල භාෂාව පිළිබඳ මනා දැනීමක් ලබා ගත් ඇය ගේ පළමු සඳහන් වන කවි වූයේ ඇය පත්තෑයමේ මාමා හට පැවසූ කවි දෙකකි.

වතුර ගෙනඒමට ගිය ඇය ගේ වතුර කළය යමෙකු සඟවා ඇති බව පසක් වී ඒ තමාගේ මාමා යැයි නොදැන ඇය කවියෙන් ම දෝෂාරෝපණය කළා ය.

| | |
|---|---|
| පුංචි රුවන් පුංචි රුවන් පුංචි | කළේ |
| වතුර අරන් ළිඳ උඩ තැබුවා ය | කළේ |
| අට පහ නොදන්නා ජඩයෙකි ඒක | කළේ |
| ගෙදර යන්න දෙනවද මගෙ පුංචි | කළේ |

කළය සැඟවූයේ පත්තෑයමේ මාමා බව දැනගත් පසු 'අටපහ නොදන්නා ජඩයෙකි ඒක කළේ' යන පදය මාරු කොට 'හැංගිලා ඉඳන් හංගලා ඒ පුංචි කළේ පත්තෑයමේ මාමා යි විහිළුවක් කළේ' යනුවෙන් පවසා කලින් කවියේ දරුණු ස්වභාවය සෞම්‍ය කරගත්තා ය.

ඇය ලියූ කවි අතරින් දෙනිපිටියේ නුග රුක පිළිබඳ වර්ණනාව සුවිශේෂ වන්නේ ය. ගමේ ආරච්චිල වරයෙක් වූ ඇගේ සැමියා ජීවත් ව සිටිය දී කවියට ඇල්මක් දැක් වූ අයෙකු නිසා දෙදෙන අතර සමහර අවස්ථාවල දී කවි හුවමාරු සිදු විණි.

වෙනත් ගමකට රාජකාරියකට යන්නට සැරසුණ ගජමන් නෝනා ගේ සැමියා ඇයට අනගි උපදෙසක් දුන්නේ මෙසේ ය.

| | |
|---|---|
| යන මෙගමන් සිදු වුණි නම් පරමා | ද |
| එනතුරු අන්දෙස නොබලන් සිතුපෑ | ද |
| අලපත වැකි පැන් විලසින් නොවහා | ද |
| සිහිව ඉඳින් ළඳෙ මා දුන් අවවා | ද |

අවවාදය පිළිගත් ගජමන් නෝනා චෝදනා කරන්නේ වෙනත් අයෙකුට ය.

| | |
|---|---|
| හිමි යන එගම්වල අඟනුන් නොවසා | ද |
| එනු විගසින් එහි නොවෙමින් පරමා | ද |
| හිමියනි ඔබ මට දැන් දුන් අවවා | ද |
| මම ඉවසම් මද රද ඉවසුම් දේ | ද |

පසුකලක දී ඇලපාත මුදලි (කලින් ඇලපාත ධම්මරතන හිමි) සමඟ ඇතිකරගත් සම්බන්ධයත් ඔවුන් දෙදෙනා අතර වූ ශෘංගාරාත්මක කවි හුවමාරුවත් නිසා ඇය අදත් සිංහල සාහිත්‍යයේ සුවිශේෂ ස්ථානයක හිමිකාරියක් වන්නී ය. ඇය ගේ සමහර කවි අනුව ඈ පිළිබඳ ව නොයෙක් මතිමතාන්තර පළ වී ඇතත් ඇය ඒ කවි පද බැඳ ඇත්තේ හුදෙක් විනෝදයටත් රිසිකයින් අමන්දානන්දයට පත්කිරීමටත් බව තේරුම් ගැනීම අපහසු නො වේ.

පහත සඳහන් වන්නේ ඇයත් ඇලපාත මුදලිත් අතර හුවමාරු වූ කවි කීපයකි.

**ඇලපාත මුදලිගේ ප්‍රශ්නය,**

| | |
|---|---|
| චන්ද සූරියා මෙනි එළඳගෙ | උවන |
| ඉන්ද නීල දෙක මෙනි ලැමද එන | තන |
| අන්ද කාරයට අවුළු‍ෑ පහන | මෙන |
| කින්ද තනි යහන නිදි යන්නේ | නෝන |

**ගජමන් නෝනා ගේ පිළිතුර,**

| | |
|---|---|
| බැන්ද මගේ හිමි පරලොව ගිය | බැවින |
| නින්ද අපට පුරුදුය තනියම | යහන |
| වින්ද රති සැපත මට මතක නැති | වුන |
| කින්ද තමුසේට විමසන්ට | කාරණ |

**කුඹුරකින් වී කරල් හිස තබාගෙන යන ස්ත්‍රීන් දැක ඇලපාත මුදලි කී කවියක්,**

රූ බර දිගැසියන් වෙල මැදට බසිමි නේ
ආ දර යෙන් කරල් මිටි රැගෙන යන තැනේ
වාසැර යෙන් ඉන ඇඳි වත ඉවත් වුනේ
වා නර මුවසෙ නැඹ මුල සුරති ගති පෙනේ

**ගජමන් නෝනා ගේ පිළිතුරු කවිය,**

කේසර එන්ට පළමුව ගජතුගෙ දක්සේ
වේසර හට වුවොත් කුරුලුට වෙයි දුක්සේ
ඒ සැර ලියෝ ඇසුවොත් මේ වග දස්සේ
වා නර මුව උලති හමයන තුරු හොස්සේ

ගජමන් නෝනා පිළිබඳ ව ඉහවහ ගිය ආදරයේ හේතුවෙන් නොයෙක් ආකාරයේ ආදර, ආයාචනා, නෝක්කාඩු, විරහ කවි බන්ධනය කළ අය අතර මුල් තැන ගන්නේ ඇලපාත මුදලි තුමා ය. ඔහු ඇය ගේ අඟපසඟ ඉරියවු නිසා තමා ගේ සිල්වත්කම බිඳී යාම ගැන ඇයට චෝදනා කළේ ය.

ම දමත් දිගු සොඬින් දස අත පිඹින් නිය
ලැමපත් පියයුරන් හස පොළඹ වන් නිය
සිරි මත් එ ගජමන් නෝනා ඇතින් නිය
තෙරහත් රඹ උයන සිඳ බිඳ හෙළන් නිය


කොතරම් පැරණි වැදගත් පරම්පරාවකින් පැවත ආවත් කාමය නැමැති සුළඟට හසු වී ඇලපාත නමැති මහා වෘක්ෂය සහමුලින් ම විනාශ වී ගිය බව ඇය පිළිතුරු වශයෙන් කීවා ය.

නා ම රැක පසිඳු ඇලපාතින පොරණ
පේ ම දළු ලමින් නැණ අතු විය දියුණ
සෝම ගුණ දහම් එල ඉදෙමින් නැමුණ
කා ම නළ වැදී සහමුල යෙන් බිඳුණ

ගජමන් නෝනා විසින් කපුගම ස්ථවිරපාදයන් වහන්සේ නමක් ගැන සාදන ලද කාව්‍ය ගබ් චක්‍රයක්.

මෙම කාව්‍ය ගබ් චක්‍රය කියවන අන්දම

නව සඳ සේ පසිඳු ගුණ සිල් නැන බර න
නරඹන දන තුති ගොස කරති යන ය න
නයනය වැනි කපුගම සකි සඳ සම න
නම සඳහන් කර අදරින් පද සව න



ගජමන් නෝනාට සමාන වූ කවිත්වයෙන් ඉහළට ආ කාන්තාවක් සිංහල කාව්‍ය වංශයේ තවත් නැත. ඒ කාන්තාව එන තෙක් අපි ඇස් දල්වාගෙන බලා සිටින්නෙමු.

## බිලිඳා

බිලිඳා හඬයි
කෑ කෝ ගසා හඬයි
මෙලොව දුටු
පළමු මොහොතේ
ලොවම එපාවී
බෙරිහන් දෙයි
සාධාරණයි
ඒ ලතෝනිය
බිලිඳාට
නමක් නැත
ඇඳුම් නැත
ගෙයක් නැත
රස්සා නැත
ගරු නම්බු නැත
උපාධි නැත
පොදි බැඳපු
සල්ලි නැත
මේ ලෝකේ
මෙවන් දේ
නැති තැන
දිලින්දෙකි ඔබ
බිලින්දෙකි ඔබ
නමුත් බිලිඳා
මේවා නැති නිසා
හැඬුවාද?
නැතිනම්
මෙවන් ලෝකෙට
බිහිවීමේ දුකට
හැඬුවාද?
ප්‍රශ්න ඇසුවත්
බිලිඳාට කතා බැරිය
පසුව ඇසුවට
කාටත් මුල අමතකය.......

*අරුන්දතී පලන්සූරිය - ලන්ඩනය*

## ගුණ දෙවියෝ පිහිට දෙන්න


සුරංගනාවියෝ ඇවිත් ඔබේ මුවට අත තබාවි
කිරි දත් ඇවිදින් ද බලා ඔවුන් එකට සිනාසේවි
පුංචි ඔබේ කිරි බෝතල අමා පැණින් පුරව යාවි
සිනහ සිසී පරසතු මල් ඔබේ ඇඟට විසිකරාවි

සිහින ලොවින් ඔබ පිබිදී කැකිරි පලා සිනාසේවි
අම්ම ඔබේ දුවගෙන විත් ඇයිද මගේ දූ අසාවි
එවිට ඔබේ පුංචි දෙනෙත් අහස දෙසට යොමු කරාවි
ආච්චි අම්මා එම විට බුදු සරණයි සෙත් පතාවි

බුදු සරණේ බලෙන් ඔබට දිගු ආයුෂ ලබා දෙන්න
නැණ නුවණින් ඉගෙන ගන්න ගුණ දෙවියෝ පිහිට වන්න
අම්ම තාත්තා සලකන උතුම් පුංචි දුවෙක් වන්න
පුංචි මදාරා මල ඔබ මිළින නොවී සුවඳ දෙන්න

*සීතා ලිලී ජයසුන්දර - ලන්ඩනය*

# ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ



කවියක් ම වූ ගැමි දිවිය සිය උරුමය කොට ගෙන සොබා සෞන්දර්යයෙන් අනූන වූ රුහුණේ ගිරුවාපත්තුවේ පුවක්දණ්ඩාව නම් ගම්මානයේ දී ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහයන් මෙලොව එළිය දුටුවේ 1913 ජූනි මස 19 වන දා ය. සොබාදහමට මහත් සේ ඇලුම් කළ ඔහු ගේ බොහෝ නිර්මාණවලට පාදක වී තිබුණේ ද ඔහු ජන්ම ලාභය ලත් ඒ බිමේ ගෙවූ අසිරිමත් ළමා වියේ චමත්කාරයයි. ඒ බව ඔහු ගේ නොපළ අත් පිටපත් තුළින් චිත්‍රණය වන්නේ මෙසේ ය.

"මගේ ගීවල කිසියම් මිහිරක් වෙතොත් එය මගේ අතීත ජීවිතයේ මිහිර විනා අන් කිසිවක් නොවේ. මේ විචිත්‍ර ලෝකයේ මා ගිය ගමන කෙරෙන් මගේ හදවතට හුරු වූ රසයක් තිබේ. මේ ගී මතු වූයේ එයිනි.

දකුණු ඉන්දිය ආධිපත්‍යයට ගොදුරු ව තිබූ පනස්වන දශකයේ සිංහල සිනමා ගීත ඉන් මුදාගෙන, අර්ථපූර්ණ, රසාලිප්ත ගීත රචනා කලාවක් කරා යොමු කිරීමේ ගෞරවය ද හිමිවන්නේ ඔහුට ය. ඉරහඳ පායන ලෝකේ, ගමන නොනිමෙයි, පාරමිතා බල පූරිත පූජිත, ගලන ගඟකි ජීවිතේ වැනි චිත්‍රපට ගීත ඊට නිදසුන් සපයයි. ඔහු රචනා කළ මුල් ම ගීතය අමරදේවයන් ගයන "කුසුම් පිපේ" නම් වසන්ත ගීතයයි.

"කුසුම් පිපේ තුරු පතරේ සතර දිගන්තේ
කෝකිල කූජනය නැගෙයි මධුර වසන්තේ"

ගුවන්විදුලියේ ප්‍රථම වතාවට සිංහල ගීත නාටක නිර්මාණ කිරීමේ පුරෝගාමිත්වය උසුලන්නේ ද මානවසිංහයෝ ය. 1955 දෙසැම්බර් 8 වන දා ප්‍රථම සිංහල ගුවන් විදුලි ගීත නාටකය වූ "මනෝහාරී" ප්‍රචාරය වීමත් සමඟ ම ගුවන්විදුලියේ ගීත නාටක රසාංගය ආරම්භ විය. අනතුරු ව මහබිනික්මන, සෙල් පිළිමය, යක්ගිරි දිවයින, සෝණ ගංතෙර, උල්පත සැලිලා ආදි ගීත නාටක රැසක් ඔහු අතින් නිර්මාණය විය.

සෞන්දර්යය ප්‍රවාහයක් වූ ඔහු ගේ ග්‍රාමීය ළමා වියේ කඩඉම පසුකරත් ම පුවක් දණ්ඩාවේ පංචථූපාරාමයේ පැවිදි විය. පසු ව උපැවිදි වූ ඔහු නැවත අඟුරුකාරමුල්ලේ පන්සලේ පැවිදි වී නැවත උපැවිදි විය. 1944 දී ශ්‍රීමතී වසන්තා කළුගමගේ මෙනෙවිය සමඟ විවාහ විය. මානවසිංහයන් පළමු ව රැකියාවකට ගියේ ඔහු ගේ කුළුඳුල් පුතු එනම් ප්‍රභාත් උපන් දා බව සඳහන් වේ. ඒ හෙළ දිව පත්‍රයේ කතුවරයෙකු ලෙසිනි. අනතුරු ව ලංකාදීප කර්තෘ මඬුල්ලේ සේවය කළේ ය. එකල ඔහු විසින් ලංකාදීපයට රචනා කරන ලද 'වගතුග' තීරය මහත් සේ ජනප්‍රිය විය. ලංකාදීපයට ලියන ලද කවි, ගීත එක්රැස් කර 'කෝමල රේඛා' නමින් කෘතියක් සම්පාදනය කරන්නට යෙදුණේ ද මේ කාලයේ ය.

මානවසිංහයන් යනු කවියෙකු, ගීත රචකයෙකු, පුවත්පත් කලාවේදියෙකු මතු නො ව ගොළු දැරිය සහ හදවත් නැත්තෝ නමින් කෙටිකතා සංග්‍රහ දෙකක් පළ කරමින් කෙටිකතා ක්ෂේත්‍රයට ද අවතීර්ණ වූවෙකි. ප්‍රථම සරසවි චිත්‍රපට උළෙල සඳහා සරස්වතී අභිවන්දන ගීතය ලියැවුණේ ද ඔහු අතිනි. 'රන්මුතු දූව' චිත්‍රපටය සඳහා හොඳ ම ගීත රචකයාට හිමි සම්මානය පිරිනැමුණේ ද ඔහුට ය.

අවසාන කාලයේ දැඩි ලෙස ගිලන් වූ ඔහු 1964 ඔක්තෝබර් 4 වන දා මෙලොව හැර ගියේ ය. මියයෑමට පෙර "මගේ අළු, වත්ත පහළ ඇහැළ ගහ යට වළලන්න" යැයි බිරිඳ ගෙන් ඉල්ලා සිටීමට ද මේ සොබාදම් හිතකාමියා අමතක නොකළේ ය. සොබාදම් දිනිතියගේ පූජෝපහාරයක් සේ ඔහු ගේ සොහොන රැකවල්ලාගෙන, සෙවන සලසන ඇහැළ ගස් පෙළෙන් අද ද ඇහැළ මල් පෙති ගිලිහී වැටුණු දක්නට හැකි ය.

උදේනි සිරිමාන්න

## අකුරට යනවයි කියලා

අකුරට යනවයි කියලා
ටිකිරි අයිය බැදිවලමයි
ඉන්නකො මම ගුරු ගෙදරට
ගිහින් කියන්නම් -
ගිහින් කියල - මේ බැද්දෙදි අල්ලල දෙන්නම්

පඳුරු අස්සෙ කුරුල්ලන්ට
ඔමරි කරනවා විතරයි
සිළිඳු ඉතින් දර කැඩුවද
මමත් කියන්නම් -
ගිහින් කියල - පොඩි නැන්දට අල්ලල දෙන්නම්

ඉදුණු කරඹ ගොඩාරියක්
මගේ ඔඩොක්කුවෙ තියෙනව
ටිකිරි අයියටත් දෝතක්
පුරවල දෙන්නම් -
පුරවල දී - තව මදි නම් හිඹුටුත් දෙන්නම්

සිළිඳුට සීපද කියන්න
කුරුල්ලන්ට මල තියන්න
ලොකු වුණා ම මේ බැද්දෙම
හේන් කොටන්නම් -
හේන් කොටල - අපි දෙන්නට පැලක් හදන්නම්

මාළු ඇඹුල්තියල් කරල
පොල් සම්බල් රසට හදල
ඇල් හාලේ බතුත් එක්ක
අනල කවන්නම් -
කවන ගමන් - මමත් කවන තරමක් කන්නම්

හැන්දෑවට කහ සුදු රතු
හෙන්දිරික්ක මල් පිපුණාම
ඒ ළඟ ගල් පොත්තක් උඩ
වාඩි කරන්නම් -
වාඩි කරල - ළඟින් ඉඳන් නළා පිඹින්නම්

ගමේ ළමිස්සියන් එක්ක
විලට ගිහින් පන් උගුලල
රටා පුරල මෝට්ටි ලා
පැදුරු වියන්නම් -
පැදුරු වියල - ඒකෙ ඉඳන් පංචි දමන්නම්

කළුවර ඇති වැහි දවසක
මහ රෑ ඇඳ ළඟින් ඉඳන්
පල් හොරු ගැන හොල්මන් ගැන
කතා කියන්නම් -
කතා කියල - බය ඇරෙන්න විහිළු කරන්නම්

- ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ

## හෙළ ඇදුරු කුමරතුඟු මුනිදසුන් වෙතටයි

ගුරු දෙවිතුමනි හෙළයට පෑ පහන් සිත
ඔබහට කියන්නට වැදගත් දෙයක් ඇත
පරදේසෙකදි මෙය වී නම් දුකක් නැත
සිංහල බිමේ සිංහලයට තැනක් නැත

හැපුණොත් ඇගේ 'වෙරි සොරි - වෙරි සොරි' කියති
ලද විට යමක් 'තැන්ක් යු' යයි තුති පුදති
වෙන් වන කලට 'චෙරියෝ, 'ගුඩ්බයි' කියති
ඉංගිරිසිය සමඟ මුළු දිවියම ගෙවති

මේ රට වෙසෙන බොහො සිංහල සිසුන් හට
නිවැරැදි සිහල වැකියක් බැහැ ලියන් නට
මෙය නොසිතනා මවුපියවරු ඔවුන් හට
දිරි දෙති ඉංගිරිසි හොඳහැටි උගැන් මට

සිංහල දත්තවුන් පෑගී මියෙද්දි ම
කළු සුද්දෝ විඳිති සම්පත් උසස්ත ම
ඉංගිරිසියට නිතර ම පුද දෙතත් මෙ ම
ලක් වැසියන් අතර ඇත මේ වෙනස්ක ම

හෙළබස රකින අන්දම නිරතුරු දෙඩුව
අය ගේ මුව අගත් ලෙලදෙන්නේ 'කඩුව'
කාහට කියන්න ද අප මේ අව නඩුව
හොඳ හැටි දැනේ අද ඔබ මෙහි නැති අඩුව

**පාතිමා සසුනා සුහයිබුල්ලා - අලුත්වීදිය, වැලිගම**

## Thank you My Dear Teacher

The tree, in it's nature expects
nothing,
but gives shade and fruit to all
others.
But The example given is wonderful
You gave me your extensive knowledge
to help me to improve my knowledge
and like the tree
you expected nothing as a reward

**Ven. B. Pemaratana - London Buddhist Vihara**

## ගාථා මොටද වඳිනට මට මගෙ අම්මා

පීතා පිහිට නොබලා වඩමින් පෙම්මා
නිතා මියුරු සැප දී මා වැඩු අම්මා
සීතා දේවි මෙන් රැකගත් කුල දම්මා
ගාථා මොටද වඳිනට මට මගෙ අම්මා

නෙත පුරා සුවසේ නිදියනු නැතුව
කුස පුරා බුදින රස අහරක් නැතුව
මට හොරා ගෙයින් පිට ගමනක් නැතුව
මා දැඩි කළා අම්මා ඉවසුම් ඇතිව

බෝකල් උසුලමින් දුක් කුස තුලේ මවා
ලෝ පල් සුරන් යදිමින් රස කිරිම පොවා
මා ඇල්මෙන් වැඩු අම්මා නමට දිවා
හැම මල් ගසම මල් පූජා කරයි හවා

□ *මුණසිංහ සිරිමාන්න*

## නිමලරාජන්ගේ අම්මා

ආත්මය මිලානව තිබිණ

මම නිමල්ගේ අම්මාට ලියුමක් ලිවීමි

"කිසිදාක දැක නැති
දයාබර අම්මේ,
ඔබ දකින්නත් ආසයි
ඔබ දැක යන්න එන්නවත්
මුන් අපිට ඉඩ දෙන්නෑ
අම්මාවරුන්වත් මෙහේ වුන් හඳුනන් නෑ
දරුකම කියන දේවත්
මේ කිසි කෙනෙක් දන් නෑ."

ඈ හැරෙන තැපෑලෙන්
මා අමතා තිබුණා ය
"පුතේ උඹෙ අත් අකුරු
නිමල් ගේ අත් අකුරු වගෙමයි
උඹ බලන්නත් ආසයි"

ඇගේ ලිපියෙන්
මගේ ආත්මය යළි වරක් විකසිත විය

සියලු බැරියර් බිඳගෙන
මම ඈ දකින්නට ගියෙමි

ඇගේ ප්‍රේමය අබියස
දෙදණින් වැටී
ඉරි තැලුණු දෙපා සිම්බෙමි
"අම්මේ ඔබෙ දෙපා
අපේ අම්මගෙ දෙපා වගෙමයි"

ඇය නැඹුරු වී
ස්නේහයේ සුරතින්
මහිස පිරිමැද්දාය
"පුතේ උඹෙ හිස
නිමල්ගේ හිස වගෙමයි"

මම සීරුවෙන්
ඈ අබියස සිට ගතිමි
"අම්මෙ ඔබෙ සුරත
අපේ අම්මගෙ සුරත වගෙමයි"

ඇය නොසෙල්ලී
නෙතු පියන් නොසොල්ලා
මා දෙසම බලාගෙන උන්නා ය

මම සිනහසීමට යත්න දැරිමි

"පුතේ උඹෙ සිනහව
නිමල්ගේ සිනහව වගෙමයි"

ඉක්බිති
ඈ දෙනෙත් අගිහෙන්
සිහින් දිය දහරක් ගලා හැළිණ

"අම්මේ ඔය කඳුළු
අපේ අම්මගෙ කඳුළු වගෙමයි"

*මංජුල වෙඩිවර්ධන*